ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය- 2023

------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ (“මණ්ඩලය’’) 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම්, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 හි 57 ඡේදය ප්‍රකාරව අස්ථිත්වය විසින් සේවක ප්‍රතිලාභ බැඳීම ගණනයේදී ආයු ගණක ක්‍රමය යොදා ගැනීම සිදු කළ යුතුය. මණ්ඩලය විසින් එසේ ආයුගණක උපකල්පන භාවිතා කරනු ලබන බව මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති නමුත් ගණනය කිරීමේ දෝෂයක් හේතුවෙන් රු.146,328,424 ක් විය යුතු සේවක ප්‍රතිලාභ වගකීම රු.188,634,080 ක් ලෙස ගණනය කර තිබීමෙන් වර්ෂයේ ලාභය රු.3,056,332 කින් ද වෙනත් විස්තීර්ණ ආදායම් රු.39,249,324 කින් ද අවගණනය වී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සේවක ප්‍රතිලාභ වගකීම රු.42,305,656 කින් අධි ගණනය වී තිබුණි. | නිරීක්ෂණයේ සඳහන් ගණනය කිරීම් නිවැරදි නොවේ. සත්‍ය ගෙවිය යුතු පාරිතෝෂික මුදලට වඩා අඩු අගයක් වාර්තා වේ.නමුත් මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු පාරිතෝෂික අගය නිවැරදිය. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ආයුගණක ක්‍රමය යොදා ගනිමින් සේවක ප්‍රතිලාභ බැඳීම ගණනය කළ යුතුය. |
| (ආ) 2016 වර්ෂයට පෙර සිට පැවත එන, ප්‍රාග්ධන ප්‍රදාන යටතේ දක්වා ඇති රු.10,500,000ක් වූ Cess Fund නම් ප්‍රදානය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 හි 26 හෝ 27 ඡේද පරිදි ක්‍රමක්ෂය කර නොතිබුණි. | මෙම ප්‍රදානය ක්‍රමක්ෂය කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කරන බව. | ප්‍රමිතියේ ප්‍රතිපාදන ප්‍රකාරව ක්‍රමක්ෂය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 වර්ෂයේදී රු.4,320,000 කට මිලදී ගත් Sage 200 මෘදුකාංගය වත්කමක් ලෙස ගිණුම් ගත නොකර කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණු අතර එම මෘදුකාංකය වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දරන ලද රු.1,750,000 ක ප්‍රාග්ධන වියදමක් වියදම් ලෙස කපා හැර තිබුණි. | Sage 200 මෘදුකාංගය වත්කම් වලට ඇතුළත් කර ක්ෂයවීම් ගැළපීමට කටයුතු කරන බව. | අස්පෘෂ්‍ය වත්කම් වටිනාකම නිවැරදිව හඳුනා ගැනීමට හා ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ)පෙර ගෙවුම් ශේෂවල ඇතුළත් වටිනාකම රු.465,000 ක් වූ දේශීය ආයුර්වේද යුෂ වර්ග නිෂ්පාදනය කළ හැකි යන්ත්‍රයක් 2021 වර්ෂයේදී මණ්ඩලය පරිත්‍යාග වශයෙන් ලබා දී තිබියදී පරිත්‍යාග ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | එය භෞතිකව නිරවුල් වී තිබුනද වවුචර ඉදිරිපත් නොවීම හේතුවෙන් ගිණුම් නිරවුල් කල නොහැකි විය .මේ වන විට අදාළ පියවීම් වවුචරය ලැබී ඇති බැවින් පියවීමට කටයුතු කරන බව. | ශේෂයන් හඳුනාගෙන අදාල ගිණුම් වලට නිවැරදිව ගැලපිය යුතුය. |
| (ඇ) 2023 වර්ෂයේ ලබා දෙන ලද රු.2,275,482 ක අත්තිකාරම් 2024 වර්ෂයේ පියවා තිබු අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2024 වර්ෂය තුළ පියවීමට අදාල වියදම් 2023 වර්ෂය තුලදී දරා ඇති බව. ඒ අනුව වියදම 2023 වර්ෂයට ගිණුම් තබා අත්තිකාරම් ගිණුම්ද එම වර්ෂයටම පියවා ඇති බව. | අත්තිකාරම් පියවන දිනට මූල්‍ය ප්‍රකාශන තුළ ගැලපීම් කිරීමට කටයුතු තළ යුතුය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු වත්කම් ගිණුම් 03 ක එකතුව රු. 74,074,924ක්, ආදායම් ගිණුම් 02 ක එකතුව රු. 27,797,748 ක් හා වගකීම් ගිණුමක වටිනාකම වූ රු. 65,632,084 ක් හා අනුරූපී වාර්තා/ උපලේඛනවල පිළිවෙලින් රු.46,506,226ක්, රු. 39,768,530 ක් හා රු. 64,907,063 ක් ලෙස දක්වා තිබීමෙන් එකී ශේෂ අතර රු. 40,264,501 ක වෙනස්කම් නිරීක්ෂණය විය. | මෙම එකිනෙක ශේෂ සැසඳීම් කොට නිවැරදි ශේෂ හඳුනා ගැනීමටත් 2024 අවසාන ගිණුම් මඟින් නිවැරදි කිරීමටත් අවශ්‍ය කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වටිනාකම් හා අනුරූපී වාර්තාවල වටිනාකම් මගින් තහවුරු විය යුතු බැවින් එසේ නොවන අවස්ථාවල ඒවා සැසඳීම් කර නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) ඉතුරුම් ගිණුමක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබු රු.4,850,853 ක පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | පොලී ආදායම ගිණුම්ගත කිරීම ප්‍රමාද දෝෂයකින් මගහැරී ඇත. මෙය පෙර වර්ෂ ගැලපීමක් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව පොලී ආදායම ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් පෙර ගෙවුම් ශේෂය තුළ පැවති 2018 වර්ෂය හා ඊට පෙර වර්ෂයන්ට අදාළ රු.6,618,086 ක්ද සමාලෝචිත වර්ෂයේදී විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණු 25,331,256 ක්ද නිරවුල් කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | කාලයෙන් කාලයට විවිධ අවස්ථාවන් වලදී පෙර ගෙවීම් ශේෂයන් නිරවුල් කිරීමේ කටයුතු සිදු වන අතර එමඟින් මෙම අගයන් අඩු වීම සිදු වන බව. | පෙර ගෙවුම් ශේෂ කාලීනව ගිණුම්වලට ගැලපීමට හා වර්ෂ ගණනාවක සිට පවතින පැරණි ශේෂ කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2017 ඔක්තෝබර් 25 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 5/2017 | චක්‍රලේඛය පරිදි සක්‍රීය සේවා කාලය පදනම් කර නොගෙන වෘත්තීය දීමනා ලෙස 2018 වර්ෂයේ සිට රු.7,717,590 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රු.15,000/- ක ඉංජිනේරු දීමනාවක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල නිර්දේශය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලැබී ඇති බවත් එයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන දීමනාව ගෙවා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව සක්‍රීය සේවා කාලය පදනම් කර නොගෙන ගෙවූ වෘත්තීය දීමනා නීති රීතිවලට පටහැනි බැවින් ආපසු අයකර ගත යුතුය. |
| (ආ) | 2022 අගෝස්තු 08 දිනැති මුදල් අමාත්‍යාංශයේ ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2022 හි 2.4 ඡේදය | චක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව 2023 වර්ෂයේදී කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් 106 දෙනෙකු බඳවාගෙන ඉන් 61 දෙනෙකු ස්ථිර කර තිබුණි. | සහායක කාර්යය මණ්ඩලය නොමැති වීමෙන් අවශ්‍ය සේවා සැපයීමේදී දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වූ නිසා පවතින පුරප්පාඩු පිරවීමට 2023 ජූනි 05 වන දින පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීමේදී තීරණය කරන ලද බව. ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් 110 දෙනෙක් උසස් වීම් සහ පත්වීම් ලබා ගෙන ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අත්‍යාවශ්‍ය සේවකයින් බඳවා ගැනීම භාණ්ඩාගාර අනුමැතිය මත සිදු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 (ආ) ඡේදය | එක් වරකදී පුද්ගලයෙකුට ලබාදිය හැකි උපරිම අත්තිකාරම් මුදල රු.100,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 12 කදී රු.125,000 සිට රු.500,000 දක්වා එකතු වටිනාකම රු.4,148,960 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | අදාළ අංශයන්හි වෙනත් සේවකයෙකුට අත්තිකාරම් ලබා ගත නොහැකි අවස්ථාවකදී මෙවැනි තත්ත්වයන් ඇති විය හැක. එවැනි අවස්ථාවකදී එය විශේෂ අනුමැතියක් සහිතව ලබා දීමට කටයුතු කරනු ලබන බව. | චක්‍රලේඛයේ සඳහන් සීමාව ඉක්මවා අත්තිකාරම් මුදල් ලබා දීමට අවශ්‍යනම් භාණ්ඩාගාර අනුමැතිය මත එය සිදු කළ යුතුය. |

### 1.8 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බැංකු ගිණුම් දෙකක තැන්පත් කර තිබූ වටිනාකම රු. 1,228,365 ක් වූ චෙක්පත් 59 ක් මාස 1 සිට මාස 11 දක්වා කාල පරාසයක සිට උපලබ්ධි වී නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | උපලබ්ධි නොවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.16,596,485 ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.126,732,525 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.110,136,040 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේදී ප්‍රදර්ශන ආදායම රු.128,258,952 කින් හා රජයේ ප්‍රදාන රු.92,795,000 කින් වැඩි වී තිබුණද ප්‍රාග්ධන ප්‍රදාන සඳහා ක්‍රමක්ෂය රු.26,250,913 කින් අඩු වී විකිණීමේ හා බෙදාහැරීමේ වියදම් රු.281,429,002 කින් සහ ප්‍රදර්ශන සමුළු හා උත්සව වියදම් රු.20,579,223කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් මාතර වැඩහල වෙත ජාතික ශිල්ප සභාව විසින් රු.3,850,740ක වටිනාකමැති යන්ත්‍ර 3ක් සකස් කිරීමට 2021 වර්ෂයේ දී ඇණවුමක් ලබා දී තිබුණ ද, මා වේවැල් කැලයෙන් ඇදීම සඳහා වන රු.351,000 ක් වටිනා යන්ත්‍රය හැර අනෙකුත් යන්ත්‍ර දෙක 2024 අප්‍රේල් අවසන් වනවිටත් වැඩ අවසන්කර ශිල්ප සභාවට භාර දී නොතිබුණි. | එම යන්ත්‍රය පරීක්ෂා කර බලා සුදුසු නවීකරණ කටයුතු සිදු කර අදාල ආයතනය වෙත භාර දීමට අවශ්‍ය කටයුතු යොදා ඇති බව. | මණ්ඩලය විසින් ඉටු කළ යුතු කාර්යභාරය නොපමාව ඉටු කිරීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලිය නිසිලෙස ක්‍රියාත්මක වනබවට සහතික විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට පවතින රු.11,535,511 ක හඳුනානොගත් තැන්පතු ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මාර්ග ගත තැන්පතු සමාන අගයන් ලෙසින් පවතින විට එක් මාර්ග ගත තැන්පතුවක් සෙසු තැම්පතුවලින් වෙන් කර හඳුනා ගැනීම දුෂ්කර බැවින් විසඳා ගත නොහැකි අගයන් Deposit Pending Settlement ගිණුමට මාරු කිරීමට සිදු වූ බව. | හඳුනා නොගත් තැන්පතු ශේෂයන් හඳුනාගෙන නොපමාව නිරවුල් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ඇ) | 2022 වර්ෂයේදී විමලසුරේන්ද්‍ර විදුලි බලාගාරයෙන් ඉවත් කරන ලද අබලි ලෝහ මිලදී ගැනීම සඳහා රු. 3,754,298 ක් ගෙවා තිබූ අතර අබලි තඹ ලෝහ ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන් මණ්ඩලයට එම භාණ්ඩ ලැබී නොතිබුණි. ඒ අනුව එම මුදල ආපසු ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉවත් කරගත යුතු අබලි ද්‍රව්‍ය ඉවත් කර ඒවා සුදුසු කර්මාන්තකරුවන් වෙත බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සූදානම් කරමින් පවතින බව. | හිඟ මුදල ලබා ගැනීමට හෝ භාණ්ඩ ලබාගැනීමට මණ්ඩලය විසින් කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්මික සංවර්ධන මණ්ඩලය සතු කාර්මික ජනපද 16 (ඇල්පිටිය කාර්මික ජනපදය හැර) හි බිම් කොටස් 733ක් පවතින අතර ඉන් බිම් කොටස් 53ක් කර්මාන්තකරුවන්ට බෙදා දී නොතිබීමෙන් වර්ෂ කිහිපයක සිට භාවිතයෙන් තොරව පැවතුණි. 2023 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ශාලා 26ක් ක්‍රියාත්මක නොවී වසා දමා තිබූ අතර ඒවා වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට කටයුතු කර නොතිබුණි. තවද මණ්ඩලය සතු කාර්මික ජනපද 05ක ඉඩම් කට්ටි 23 ක් පුද්ගලික පදිංචිය සඳහා භාවිතයට ගෙන තිබුණි. | හිස් බිම් කොටස් පවතින ජනපද සංවර්ධනය කර නව ආයෝජකයින් පෙළඹවීම හා ආයෝජකයින් දිරිගැන්වීම ග්‍රාමීය මට්ටමින් සිදු කරමින් පවතී. පුද්ගලික පදිංචිකරුවන් කර්මාන්ත සඳහා යොමු කිරීම හෝ එම බිම් කොටස් නව ආයෝජකයන් වෙත ලබා දීමේ කටයුතු දිගටම සිදු කරමින් පවතින බව. | නිෂ්කාර්යව පවතින බිම් කොටස් හා කම්හල් වෙනත් කර්මාන්තකරුවන්ට බෙදා දීමට හා ඵලදායී ලෙස කර්මාන්ත ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පහසුකම් සැලසිය යුතුය. |
| (ආ) | 2016 අගෝස්තු 17 දින අමප/16/1424/723/039 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් රජයේ දායකත්වයක් සහිතව නවබිම පෙර වැඩුම් මධ්‍යස්ථානයේ පිහිටවූ රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය වෙනුවෙන් ගොඩනැගිලි නවීකරණය, වැටුප් හා වේතන ලෙස රු.මිලියන 51 ක් වැයකර තිබුණු අතර | රොබෝ තාක්ෂණය සඳහා වන විශිෂ්ඨතා මධ්‍යස්ථානය අප විසින් ඉතා සුදුසු පරිදි ස්ථාපිත කිරීමට උත්සාහ කලද මෙම මධ්‍යස්ථානය විවිධ අමාත්‍යාංශ යටතේ පැවති අතර දැනට මෙම මධ්‍යස්ථානයේ හිමිකාරීත්වය | ව්‍යාපෘතිය කඩිනමින් නැවත ආරම්භ කර එහි අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | 2018 හා 2019 වර්ෂයන්හිදී රු.මිලියන 35 ක් වටිනා රොබෝ තාක්ෂණික උපකරණ ස්ථාපිතකර තිබුණද අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා එහි කටයුතු ආරම්භ කිරීම සිදු කර නොතිබුණි. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පැවති මෙම මධ්‍යස්ථානය කර්මාන්ත අමාත්‍යාංශයටත් 2023 වර්ෂය අවසන් වන විට නැවත තාක්ෂණ අමාත්‍යාංශයටත් වරින් වර මාරු වී තිබුණි. 2023 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය සඳහා IRB 2600 welding power source එකක්, Reproving of 45 existing Robot cell එකක් හා එය භාවිතා කිරීමට දින 04කට ඉංජිනේරුවන් දෙදෙනෙකු පුහුණුකිරීම හා වෙනත් වියදම් ඇතුළුව රු.5,164,149 ක් දරා තිබුණි. කෙසේ වුවද ලංකාවේ කර්මාන්ත වලට ධෛර්යය දීම, ඒවා වැඩි දියුණු කිරීම හා සංවර්ධනයට සහාය වීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණ ද 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙය ක්‍රියාත්මක මට්ටමක නොපැවතුණි. | මණ්ඩලය සතුව නොමැත.<br><br>නමුත් මෙම රොබෝ යන්ත්‍ර අලුත්වැඩියා කර ඉදිරි වැඩ කිරීමට අවශ්‍ය කටයුතු අප විසින් ඉටු කරමින් පවතින බව. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පැලියගොඩ රබර් සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයට රබර් ආශ්‍රිත නිෂ්පාදන වල ගුණාත්වය වැඩි දියුණු කිරීම, නාස්තිය අවම කිරීම, නිෂ්පාදන ක්‍රියාවලියේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම හා නිෂ්පාදන පිරිවැය අවම කිරීම, සුළු හා මධ්‍යම මට්ටමේ කර්මාන්ත වලට භාවිතය හඳුන්වා දීම හා දිරිගැන්වීම ආදිය අරමුණු පෙරදැරිව රබර් ඉන්ජෙක්ෂන් මෝල්ඩිං යන්ත්‍රයක් 2016 වර්ෂයේදී රු.9,318,026 ක මුදලකට මිලදී ගෙන තිබුණි. මිලදී ගත් දින සිට පුහුණු ලාභීන් 328 දෙනෙකුට පමණක් පුහුණුව ලබා දී තිබූ අතර, 2020 වර්ෂයේ සිට 2024 වර්ෂයේ විගණිත දින වන විටත් මෙමෙ යන්ත්‍රය ක්‍රියාකාරී මට්ටමකින් තොරව පැවතිණි. | මේ වන විට ඉංජෙක්ෂන් මෝල්ඩින් යන්ත්‍රයේ අළුත්වැඩියා කටයුතු සිදුවෙමින් පවතින බව. | යන්ත්‍රය ඵලදායීව භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පැලියගොඩ රබර් භාණ්ඩ සංවර්ධන හා සේවා මධ්‍යස්ථානයේ රබර් ආශ්‍රිත යන්ත්‍රෝපකරණ 64 ක් පැවති අතර ඉන් යන්ත්‍ර 26 ක් වර්ෂ 1 ක සිට වර්ෂ 39 ක් දක්වා කාල පරාසයක සිට අක්‍රියව පැවති අතර රු.85,560ක් වූ Compressor යන්ත්‍රය 2017 වර්ෂයේ සිට භාවිතයකින් තොරව ඇසුරුම් වලම ගබඩාවේ පැවතිණි. තවද, එහි පවතින අමුද්‍රව්‍ය වර්ග 17ක් හා යන්ත්‍ර අමතර කොටස් වර්ග 284 ක් වර්ෂ 1 සිට වර්ෂ 17 ක් දක්වා කාල පරාසයක සිට භාවිතා කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතිණි. | නිෂ්කාර්ය යන්ත්‍ර සූත්‍ර, අමුද්‍රව්‍ය හා අමතර කොටස් බැහැර කිරීම සඳහා භාණ්ඩ සමීක්ෂණ කමිටුව වෙත යොමු කොට ඇත. උපදේශක කමිටුවක් පත් කර ඒවා ඉවත් කිරීමට කටයුතු කරනු ඇති බව. ඉතා පැරණි දැනට භාවිතා වන කොම්පෙෂර් යන්ත්‍රය අක්‍රිය වන අවස්ථා වලදී අලුත් වැඩියාවට දීර්ඝ කාලයක් ගතවන බැවින් නව යන්ත්‍රය භාවිතා කරනු ලබන අතර පසුව ඉදිරි ප්‍රයෝජනය සඳහා තබා ඇති බව. | භාවිතයට නොගත් යන්ත්‍ර භාවිතයට ගැනීමට සුදුසු සැලැස්මක් සැකසීමටත් අක්‍රිය යන්ත්‍ර ඉවත් කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2020 වර්ෂයේ යුනිඩෝ ආයතනය විසින් ඇ.ඩො. 101,130ක් වටිනා යන්ත්‍ර උපකරණ 12 ක් සහ ඇ.ඩො.1167.44 ක් වටිනා භාණ්ඩ මණ්ඩලයට ලබාදී ඒවා ලක්සල ගොඩනැගිල්ලේ ස්ථාපනය කර තාවකාලිකව උණ දැව පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කර තිබුණි. 2022 සැප්තැම්බර් මස මෙම පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ජාතික ශිල්ප සභාවට පැවරීම නිසා එහි තිබූ යන්ත්‍ර උපකරණ ඉවත් කර කටුබැද්ද නවබිම පරිශ්‍රයේ ගොඩනැගිල්ලක අසුරා තිබීමෙන් 2024 මැයි වන විටත් ඒවා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතිණි. | උණ දැව පුහුණු මධ්‍යස්ථානය නවබිම පරිශ්‍රයේ ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබුණ ද, මේ වන තෙක් ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු සිවිල් ඉංජිනේරු අංශයෙන් අවසන් කල වහාම යන්ත්‍ර සවිකර පුහුණු කටයුතු ආරම්භ කිරීමට නියමිත බව. | වත්කම් ඵලදායීව භාවිතා කිරීමට හා ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව අංශ 07 ක් සඳහා සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 83 කින් ක්‍රියාකාරකම් 18 ක් ඉටුකර නොතිබුණි. | අපේක්ෂිත ක්‍රියාකාරකම් වසර මුලදී තීරණ ගනු ලැබුවත් ක්‍රියාවට නැංවීමේදී මෙවැනි සුළු අඩු වීම් දක්නට හැකියාව තිබෙන බව. | බලපෑහැකි සියළු සාධක සලකා බලා ක්‍රියාකාරකම් සැලසුම් කළ යුතු අතර සැලසුම් කළ ක්‍රියාකරකම් ඉටුකර ගැනීමට පියවර ගත යුතුය. |